# මහා ශිෂ්‍ය සංගමය
# කොළඹ විශ්වවිද්‍යාලය
# Main Students' Union
# University of Colombo
# கொழும்பு பல்கலைக்கழகத்தின்
# முன்னணி மாணவர் சங்கம்.

E-mail-uoc.mainstudentsunion@gmail.com


සභාපති,
මහා ශිෂ්‍ය සංගමය,
කොළඹ 07.
2021.11/02

ජනාධිපති,
ජනාධිපති කාර්යාලය,
කොළඹ 1,

අතිගරු ජනාධිපතිතුමනි,

<u>කොළඹ විශ්වවිද්‍යාලයේ කුලපති පදවිය සඳහා මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමියන් පත් කිරීම සම්බන්ධවයි.</u>

ඕනෑම විශ්වවිද්‍යාලයක ඉතාමත් ගෞරවනීය ම සහ උත්තරීත ම පදවිය ලෙස හඳුන්වනු ලබන්නේ විශ්ව විද්‍යාලයේ කුලපති තනතුරයි. කුලපති තනතුර සඳහා ව්‍යවස්ථාපිත පරිපාලන බලතල කිසිවක් නොමැති වුවද විශ්වවිද්‍යාලයේ සංකේතීය සහ විශ්වවිද්‍යාලයේ ගෞරවනීය සංකේතය වන්නේ කුලපති තනතුරයි.විශේෂයෙන්ම උපාධි ප්‍රධානෝත්සවයේදී උපාධිය පිරිනැමීම ඇතුළු ගෞරවනීය අවස්ථාවන්හිදී කුලපති හරහා විශ්වවිද්‍යාලය නියෝජනය වන්නේ එම නිසාය.

කෙසේ නමුත් කොළඹ විශ්වවිද්‍යාලයේ මීළඟ කුලපති තනතුරු සඳහා **මුරුත්තෙට්ටුවේ ආනන්ද** හිමියන් රජය විසින් පත්කොට ඇත. නමුත් කොළඹ විශ්වවිද්‍යාලයේ මහා ශිෂ්‍ය සංගමය සහ ශිෂ්‍ය ප්‍රජාව ලෙස එම පත් කිරීම සඳහා අප එකහෙළා අපගේ විරුද්ධත්වය ප්‍රකාශ කර සිටින්නෙමු. මන්ද විශ්ව විද්‍යාලයක කුලපති තනතුරු යනු කිසිදු විටක දේශපාලන පත් කිරීමක් හෝ දේශපාලන න්‍යාය පත්‍රය අනුව සිදු නොවිය යුතු බව අප විශ්වාස කරන බැවිනි. තවද විශ්වවිද්‍යාලයේ පරිපාලනයේ ස්වාධීනත්වයක් ගෞරවයත් ආරක්ෂා වන්නේ එම තත්ත්වය තුළ ය. නමුත් විශ්වවිද්‍යාලයේ කුලපති තනතුරට දේශපාලනික පත්කිරීමක් සිදුකිරිම තුළ විශ්වවිද්‍යාලයේ පරිපාලනයේ ස්වාධීනත්වයත්,විශ්වවිද්‍යාලයේ ගෞරවයක් යන දෙකම විනාශ වී යා හැකි බවට අප විශ්වාස කරන්නෙමු.
එබැවින් විශ්වවිද්‍යාල ඉතිහාසය තුළ කීර්තිමත් ඉතිහාසයක් සහ වර්තමානයේ ද කීර්තිමත් විශ්වවිද්‍යාලයක් වන කොළඹ විශ්වවිද්‍යාලයට මෙම දේශපාලන පත් කිරීම සිදුකිරිම සම්බන්ධයෙන් මහා ශිෂ්‍ය සංගමය ලෙසත් සමස්ත සිසු ප්‍රජා වෙනුවෙනුත් අපගේ දැඩි විරෝධය ප්‍රකාශ කර සිටින්නෙමු.

මීට විශ්වාසී,



අමිල බුද්දික
සභාපති,
මහා ශිෂ්‍ය සංගමය ,
කොළඹ විශ්වවිද්‍යාලය



ජනිත් හේවගේ
විද්‍යා පීඨය
ශිෂ්‍ය නියෝජිත



පුනු ජයකොඩි
සභාපති
වෛද්‍ය පීඨ ශිෂ්‍ය සංගමය



විමුක්ති ජයසුන්දර
සභාපති
ශ්‍රීපාලි මන්ඩපය ශිෂ්‍ය සංහමය



සචින්ත ධනපාල
සභාපති
භේද පීඨ ශිෂ්‍ය සංගමය



රුවන් පුෂ්පකුමාර
සභාපති
මූල්‍ය හා කළමනාකරණ පීඨ ශිෂ්‍ය



පසිඳු දසනායක
සභාපති
දේශීය වෛද්‍ය ශිෂ්‍ය  ස



හිරුන හෙට්ටි ආරච්චි
ශිෂ්‍ය නියෝජිත
ශාස්ත්‍ර පීඨය



රුචික ලක්ෂාන්, ශිෂ්‍ය නියෝජිත, නීති පීඨය

පිටපත් -

අගමැති කාර්යාලය.
උසස් අධ්‍යාපන අමාත්‍යංශය.
විශ්ව විද්‍යාළ ප්‍රතිපාදන කොමිශන් සභාව.

කොළඹ විශ්වවිද්‍යාළයේ උපකුලපති.කොළඹ
විශ්ව විද්‍යාළයේ සියලු පියාදිපතිතිවරු